

# දිශා 15

ප්‍රධාන දිශා හඳුනා ගනිමු.




**1** පහත රූපය දෙස බලා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(1) නිවසට උතුරු දිශාවෙන් පිහිටා ඇත්තේ කුමක් ද?

(2) නිවසට දකුණු දෙසින් පිහිටා ඇත්තේ කුමක් ද?

(3) නිවසට නැගෙනහිර දිශාවෙන් පිහිටා ඇත්තේ කුමක් ද?

(4) මල් පාත්තියට නැගෙනහිර දිශාවෙන් පිහිටා ඇත්තේ මොනවා ද?

(5) ගේට්ටුවට උතුරු දිශාවෙන් පිහිටා ඇත්තේ මොනවා ද?

(6) ළිඳට බස්නාහිර දිශාවෙන් පිහිටා ඇත්තේ මොනවා ද?



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

# දිශා

## 15


**2** පහත දැක්වෙන්නේ කුඹියෙකුගේ ගමන් මාර්ගය පිළිබඳ විස්තරයකි. අදාළ ගමන් මාර්ගය අඳින්න.

(1) P ස්ථානයේ සිට කොටු 3ක් නැගෙනහිරට ගමන් කරයි.


(2) එතැන් සිට උතුරු දිශාවට කොටු 5ක් ගමන් කරයි.

(3) එතැන් සිට බස්නාහිර දිශාවට කොටු 3ක් ගමන් කරයි. කුඹියා දැන් සිටින්නේ ආරම්භක ස්ථානයට කුමන දිශාවෙන් ද?

(4) එතැන් සිට කුඹියා කොටු 5ක් දකුණු දිශාවට පැමිණේ. දැන් කුඹියා සිටින්නේ කොතැන ද?




**3** රූපයේ දැක්වෙන්නේ නගර කිහිපයක පිහිටීම දැක්වෙන සැලැස්මකි. ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(1) C නගරයට උතුරින් පිහිටා ඇති නගරය කුමක් ද?

(2) E නගරයට නැගෙනහිරෙන් පිහිටා ඇති නගර මොනවා ද?


(3) B නගරයට දකුණින් පිහිටි නගරය කුමක් ද?

(4) C නගරයට බටහිරින් පිහිටි නගර මොනවා ද?

# දිශා

## 15

**4** පහත දී ඇති උපදෙස්වලට අනුව ගැළපෙන රූපය කොටුව තුළ අඳින්න.






(1) ගසට උතුරෙන් කුරුල්ලෙකු අඳින්න.

(2) ගසට නැගෙනහිරින් සමනළයෙකු අඳින්න.

(3) කුරුල්ලාට දකුණෙන් ළමයෙකු අඳින්න.

(4) සමනළයාට බස්නාහිරෙන් හාවෙකු අඳින්න.